## රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදල

### 1. මූල්‍ය ප්‍රකාශන

#### 1.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2011 දෙසැම්බර් 31 දිනට රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

#### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

##### 1.2.1 උසස් ගිණුම්කරණ පරිචයන්

සමාලෝචිත වර්ෂය සඳහා වූ අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් ඉදිරිපත්කර නොතිබුණි.

##### 1.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

අරමුදල සඳහා ගිණුම් තැබීමේදී අදාල කරගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමඟ අනාවරණය කර නොතිබුණි.

##### 1.2.3 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1988 අංක 83 දරන රේගු (සංශෝධිත) පනතේ 153(2) වගන්තිය අනුව දණ්ඩන ආදායමින් දැරීමට ව සියළු වියදම් අඩුකළ පසු ඉතිරි මුදලින් 50% ක් රේගු නලධාරීන්ගේ ත්‍යාග අරමුදලට වෙන්කර නිළධාරීන්ට හා ඔත්තුකරුවන්ට ත්‍යාග ලෙස බෙදා දමට හැකි වන පරිදි රෙගුලාසි පනවා තිබුණි.

ඒ අනුව විමර්ශන කටයුතු සිදුකරන සියළුම නිලධාරීන්ට එම කාලය සඳහා රේගු අතිකාල අරමුදලින් ගෙවා තිබුණු අතිකාල මුදල් මෙසේ දණ්ඩන ආදායමින් අඩුකළ යුතු වුවද, එසේ නොකර රේගු අතිකාල හා නැව්බඩු පරීක්ෂණ ගාස්තු අරමුදලේ වියදමක් ලෙස ගිණුම් ගත කර තිබුණි. එසේම විමර්ශන කටයුතු සඳහා දරන අතිකාල පිරිවැය පිළබඳ වෙනමම වාර්තා පවත්වා ගෙන ගොස් නොතිබුණු හෙයින් විමර්ශන කටයුතු සඳහා දරා ඇති අතිකාල පිරිවැය ගණනය කළ නොහැකි විය.

(ආ) දැනට පවත්නා රේගු ත්‍යාග යෝජනා ක්‍රමය මගින් රාජ්‍ය ආදායම සුරක්ෂිත කිරීම සඳහා සිදු වී ඇති දායකත්වය මතභේදාත්මක බව වරින්වර විගණන විමසුම් මගින් හා විගණන වාර්තා මගින් පෙන්වා දී තිබුණද ඒ සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශ්වයන්ගේ අවධානය යොමු වී නොතිබණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ අරමුදලේ මෙහෙයුම් අතිරික්තය රු.57,693,497 ක් ව අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.65,727,779 ක් වයෙන් , මෙහෙයුම් ප්‍රතිඵලවල රු.8,034,282 ක අඩුවීමක් නිරීක්ෂණය විය. දන්ඩන ලෙස එකතු කර තිබුණ ආදායම ඉකුත් වර්ෂයට වඩා 18% කින් අඩුවීම මූල්‍ය ප්‍රතිඵලයේ අඩුවීම සඳහා මූලික වශයෙන් බලපා තිබුණි. කෙසේ වුවද, මෙම අරමුදලේ ගිණුම් තැබීමේ ක්‍රියාවලිය තුළ මූල්‍ය ප්‍රතිඵලයන් අපේක්ෂා කරන බවක් නිරීක්ෂණය නොවූ අතර ආදායම් වියදම් ගිණුමේ අතිරික්තය තුළින් නිරූපණය වන්නේ ශේෂ පත්‍රයේ පවතින උප අරමුදල් වලට වෙන් වන මුදල් ප්‍රමාණයන් බවත් නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

රේග බදු වංචාවන්, නීතිවිරෝධී ආනයනයන් හා ආනයන පාලන රෙගුලාසි උල්ලංඝනය කිරීම් වැනි නීතිවිරෝධී ක්‍රියා රේගු නිලධාරීන් විසින් අනාවරණය කර ගන්නා අවස්ථාවල ද පනවන දණ්ඩන මුදල්, රාජසන්තක කල මුදල් හා රාජසන්තක භාණ්ඩ විකිණමෙන් ලද මුදල් යනාදියෙන් 50% ක කොටසක් නිලධාරීන් හා ඔත්තුකරුවන්ට ත්‍යාග ලබා දීම සඳහා මෙම අරමුදලට බැර කරනු ලැබේ.

ඉදිරිපත් කරන ලද තොරතුරු වලට අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සහ ඉකුත් වර්ෂ හයකට අදාලව අරමුදලේ ආදායම් , වියදම් හා ශුද්ධ මෙහෙයුම් ප්‍රතිඵල සම්බන්ධ තොරතුරු පහත දක්වා ඇත.

| වර්ෂය | ආදායම | වියදම | | | | මුළු වියදම | අතිරික්තය/ (ඌනතාවය) |
|---|---|---|---|---|---|---|---|
| | | නිලධාරීන්ට ගෙවීම | ඔත්තුකරුවන්ට ගෙවීම | රදවා ගැනීමේ බදු / දේශීය ආදායම් දෙපා: | අනෙකුත් | | |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 2005 | 499,855,007 | 397,283,588 | 35,206,949 | 2,653,423 | 66,978,531 | 502,122,491 | (2,267,484) |
| 2006 | 594,567,776 | 446,300,470 | 44,183,900 | 6,443,292 | 64,578,911 | 561,506,573 | 33,061,203 |
| 2007 | 1,171,679,881 | 810,441,327 | 72,757,307 | 105,428,768 | 111,382,303 | 1,100,009,705 | 71,670,176 |
| 2008 | 895,773,758 | 678,463,260 | 55,144,035 | 8,693,891 | 119,792,064 | 862,093,250 | 33,680,508 |
| 2009 | 968,064,233 | 716,618,818 | 84,506,905 | 9,132,859 | 113,226,650 | 923,485,232 | 44,579,001 |
| 2010 | 902,474,770 | 687,504,664 | 37,556,075 | 9,328,789 | 102,357,464 | 836,746,992 | 65,727,779 |
| 2011 | 873,979,003 | 574,047,509 | 106,080,370 | 33,927,845 | 102,229,782 | 816,285,506 | 57,693,497 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුල රේගු නිළධාරීන්ගේ ත්‍යාග අරමුදලට ලැබී ඇති ආදායම රු 28,495,767 කින් අඩු වී තිබුණ අතර, එම අඩුවීම ප්‍රතිශතයක් ලෙස 3% ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ දී ත්‍යාග ලෙස නිලධාරීන්ට ගෙවන ලද රු.574,047,509 ක් වු මුදල ඉකුත් වර්ෂයේ ගෙවන ලද රු.687,504,664 ක් වූ මුදල හා සසදන කල එය රු.113,457,155 ක් හෙවත් 16.5% ක අඩු වීමක් විය. එහෙත් 2011 වර්ෂය වෙනුවෙන් ගිණම් අංශයට ලැබී ඇති නමුත් 2011 දෙසැම්බර් 31 දින දක්වා ගෙවා නොතිබුණු රු.192,536,859 ක් වූ ත්‍යාග ලැයිස්තු 45 ක් විය.

(ඇ) රේගු ආඥා පනතේ 153 (2)(ආ) වගන්තිය ප්‍රකාරව නිකුත්කර ඇති දෙපාර්තමේන්තු නියෝග අංක 118 මගින් නිලධාරීන් හා ඔත්තුකරුවන් අතර ත්‍යාග මුදල් බෙදා හැරීමේ යෝජනා ක්‍රමය හඳුන්වා දී තිබුණු අතර, 2009, 2010 හා 2011 වර්ෂ වල දී පිළිවෙලින් රු. මිලියන 801 ක් 725 ක් හා 680 ක් වශයෙන් එකතුව රු. මිලියන 2,206 ක් නිලධාරීන් හා ඔත්තුකරුවන් අතර බෙදා හැර තිබුණි. මින් රු. මිලියන 1,978 ක් හෙවත් 90% ක් නිලධාරීන් වෙත ගෙවා තිබුණු ත්‍යාග මුදල් විය. ලබා දිය හැකි ත්‍යාග මුදල් පිලිබඳ උපරිම සීමා පනවා නොමැති බව

ද නිරීක්ෂණය විය. ඒ අනුව සමහර නිලධාරීන් සඳහා එක් වරකදී රු. මිලියන 90 ද ඉක්මවා ත්‍යාග ලෙස ගෙවූ අවස්ථා නිරීක්ෂණය විය.

(ඈ) ඉන්ධන ගිණුම

නිශ්චිත නිර්ණායක හඳුනාගැනීමකින් තොරව ත්‍යාග අරමුදලින් කොටසක් ඉන්ධන ගිණුම සඳහා වෙන් කරනු ලබන අතර, සමාලෝචිත හා ඉකුත් වර්ෂයන්හි දෙසැම්බර් 31 දිනට මෙම ගණුමේ ශේෂය පිළිවෙලින් රු.164,569,058 ක් හා රු.182,653,578 ක් විය. ශ්‍රී ලංකා රේගුවේ වැය ශීර්ෂය යටතේ ඉන්ධන වියදම් සඳහා ලැබී තිබුණු ප්‍රතිපාදනයන්ට අමතරව මෙම ගිණුම මගින් පිළිවෙලින් රු.3,000,000 ක් හා රු.2,872,905 ක් ඉන්ධන වියදම් සඳහා දරා තිබුණි. මේ සඳහා ලබාගත් විධිමත් අනුමැතියක් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

(ඉ) විෂ මත්ද්‍රව්‍ය ගිණුම

නිශ්චිත නිර්ණායක හඳුනාගැනීමකින් තොරව ත්‍යාග අරමුදලින් කොටසක් විෂ මත්ද්‍රව්‍ය අරමුදල සඳහා වෙන් කරනු ලබන අතර 2011 දෙසැම්බර් 31 දිනට එහි ශේෂය රු.50,264,634 ක් විය. ඉකුත් වර්ෂයේ මෙම ගිණුමෙන් රු.500,000 ක වියදමක් දරා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී මෙම අරමුදලින් කිසිදු වියදමක් දරා නොතිබුණි.

(ඊ) ආපසු තැන්පත් ත්‍යාග ගිණුම

මෙම ගිණුමේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.18,003,443 ක් විය. විටින් විට දෙපාර්තමේන්තු විසින් නිකුත් කරන ලද ත්‍යාග ලැයිස්තු වලින් අදාළ ත්‍යාග මුදල් ලබා නොගත් නිලධාරීන්ගේ මුදල් මෙම ගිණුමට බැර කරනු ලැබේ. එසේම එම නිලධාරීන්ට අදාළ මුදල් නැවත ඉල්ලීම් කරන අවස්ථාවේදී අදාළ ගෙවීම් මෙම ගිණුමට හර කරනු ලැබේ. වර්ෂය තුල මෙම ගිණුමෙන් රු.33,002,285 ක් ගෙවා තිබුණු අතර, රජයේ ආදායමට බැර කල ප්‍රමාණය රු.3,541,430 කි. එසේම වර්ෂය තුලදී මෙම ගිණුමට රු.41,884,915 ක් ලැබී තිබුණි.

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂය තුල අයවැයගත හා තත්‍ය ආදායම් හා වියදම් අතර ප්‍රමාණාත්මක විචලතාවයන් නිරීක්ෂණය වූ හෙයින් අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස භාවිතා කර ඇති බවක් නිරීක්ෂණය නොවීය.

5. **පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අවධානයට යොමු කරන ලදී. පහත සදහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

(අ) ලෙජර් ගිණුම්

(ආ) තෑගි අරමුදලට අදාල උප අරමුදල්

(ඇ) තෑගි මුදල් බෙදා දීම